# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2388/31 - 2024 ජුනි මස 12 වැනි බදාදා - 2024.06.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 4/2013

**(276 වන අධිකාරය වූ) නීති අධ්‍යාපන සහා ආඥාපනත**

(276 වන අධිකාරය වූ) නීති අධ්‍යාපන සහා ආඥාපනතේ 7 වන වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සංස්ථාගත නීති අධ්‍යාපන සභාව විසින් සාදන ලද රීති.

(සංස්ථාගත නීති අධ්‍යාපන සභාව සඳහා සහ ඒ වෙනුවට අත්සන් කරනු ලබන,) සංස්ථාගත නීති අධ්‍යාපන සභාව

2024 ජුනි මස 10 වැනි දින,
කොළඹ දී ය.

රීති

කලින් කලට සංශෝධිත පරිදි වූ, (276 වන අධිකාරය වූ) නීති අධ්‍යාපන සහා ආඥාපනතේ 7 වන වගන්තිය යටතේ සාදන ලද රීති, එහි 23 වන රීතිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි (3) වන අනුරීතියේ (අ) ඡේදයේ (iii) වන අනුඡේදයේ "ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව" යන වචන වෙනුවට "සභාව" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (3) වන අනුරීතියේ (ආ) ඡේදයේ "ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින්" යන වචන වෙනුවට "සභාව විසින්" යන වචන ආදේශ කිරීමෙන්;

1A - PG 6715 — 379 (2024/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(3) එහි (8) වන අනුරීතියේ අතුරු විධානය ඉවත් කිරීමෙන්;

(4) එහි (10) වන අනුරීතිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(10) (අ). (2) වන අනුරීතියේ සඳහන් පොදු ප්‍රවේශ විභාගය සඳහා වූ යම් අපේක්ෂකයෙකු විසින් පහත සඳහන් ලිඛිත ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතුය-

(i) සාමාන්‍ය දැනීම;

(ii) සාමාන්‍ය බුද්ධිය;

(iii) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාව; සහ

(iv) සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව පිළිබඳ ප්‍රවීණතාව.

(ආ) යම් අපේක්ෂකයකු විසින්, මේ අනුරීතියේ (අ) ඡේදයේ (i) වන සහ (ii) වන අනුඡේදවල සඳහන් සාමාන්‍ය දැනීම සහ සාමාන්‍ය බුද්ධිය යන ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සැපයීම පිණිස සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යය තෝරාගනු ලැබිය හැකි ය.

(ඇ) (අ) ඡේදයේ සඳහන් ප්‍රශ්න පත්‍ර වලින් එකකට හෝ කිහිපයකට සියයට හතළිහකට වඩා අඩු ලකුණු ප්‍රමාණයක් ලබාගන්නා ලද යම් අපේක්ෂකයකු ප්‍රවේශය සඳහා තෝරාගනු නොලැබිය යුතු ය.

(ඈ) කුසලතා අනුපිළිවෙල අනුව ප්‍රවේශය සඳහා සුදුසුකම්ලත් අපේක්ෂකයන් තෝරා ගැනීමේ දී, සාමාන්‍ය දැනීම සහ සාමාන්‍ය බුද්ධිය ප්‍රශ්න පත්‍රවලට ලබාගත් ලකුණු ප්‍රමාණය සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(ඉ) ඉහත සඳහන් විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා වෙන් කරන ලද කාලය පහත දැක්වෙන පරිදි විය යුතු යː-

(i) සාමාන්‍ය දැනීම ප්‍රශ්න පත්‍රය සඳහා පැයක්;

(ii) සාමාන්‍ය බුද්ධිය ප්‍රශ්න පත්‍රය සඳහා පැයක්ː

(iii) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ප්‍රශ්න පත්‍රය සඳහා පැයයි විනාඩි තිහක්; සහ

(iv) සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ප්‍රශ්න පත්‍රය සඳහා පැයයි විනාඩි තිහක්.".

EOG 06 - 0113

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.